## 207 ඉඩ දෙන්නෙපා

ඉඩ දෙන්නෙපා විශ්වාසයේ – පහන නිවී යන්න
අඳුරේ ගැලී යයි ජීවිතේ – අවදිවැලා ඉන්න

තෝමසුවන්ගේ අවිශ්වාසේ – සුවකල සැටි පුදුමෙකි සමිඳේ
ඔබේ වතට වත දුන් එදිනේ – හරි වැටහුම ඔහුටද ලැබුණේ

ඒ සවුවාණන් ලංවැ බියේ – තුවාල සියැසින් බලා ඔබේ
පෙව්වා අත පෙව්වා පමණේ – ඔහු සිත සංකා දුරුවැ ගියේ

බලව් බලව් හදවත මාගේ – කියමින් ඔබෙ හදපට වැවේ
සකල මිනිස් වග වෙත සෙනෙහේ – නොසිඳෙන පෙම පිළිබිඹු වූයේ

හෙල්ලෙන් විවර වූ තුවාලයේ – සඟවා ගනු අප හැම මොහොතේ
සමිඳුනි ඔබ විඳි දෙතිස් වදේ – අපට විමුක්තිය ගෙන දුන්නේ